# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2003 අංක 6 දරන
## මුදල් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 පෙබරවාරි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 පෙබරවාරි මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 4.25 යි.

තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

# 2003 අංක 6 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2003 පෙබරවාරි මස 27 වැනි දින]

එල්. ඩී.–ඕ. 92/2002.

## 2002 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2003 අංක 6 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (2002 අංක 30 දරන පනතින් සංශෝධිත) 2002 අංක 11 දරන මුදල් පනත, ඒ පනතේ I වන කොටසේ (වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද) 2 වන වගන්තියේ අතුරු වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— — 2002 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටසේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

> "එසේ වුව ද, සකස් කොට නැවත අපනයනය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද භාණ්ඩයක් සම්බන්ධයෙන් වන විට, ඒ භාණ්ඩයේ පිරිවැය, රක්ෂණය සහ නැව් ගාස්තු වටිනාකම මත වූ බද්ද සියයට 0.5 ක අනුප්‍රමාණයකින් අයකර ගනු ලැබිය යුතු ය.".

3. රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2003 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයෙන් අවසන් වන කාලය තුළ යම් තැනැත්තකුගෙන් ඒ භාණ්ඩයක පිරිවැය, රක්ෂණ සහ නැව් ගාස්තු අගය මත, 2 වන වගන්තියට අනුකූලව ගාස්තුවක් රැස්කරන අවස්ථාවක, එම ගාස්තු රැස්කිරීම වලංගු ආකාරයෙන් කරනු ලැබ හා කරන ලද ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු අතර එම ගාස්තු රැස්කිරීම හා සම්බන්ධ සියලු සිවිල් හෝ අපරාධ නඩුවල දී වගකීමෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙයින් නිදහස් කරනු ලැබේ. — වලංගුභාවයට පත් කිරීම.

4. මේ පනතේ 2 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට කරන ලද සංශෝධනය 2003 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය. — සංශෝධනය ක්‍රියාත්මක වන දිනය.

5. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා **පසුව එළඹෙන** එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.